**මධ්‍යම පළාත් සභාව - 2017**

**------------------------------**

මධ්‍යම පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල
----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 අනෙකුත් ගිණුම්
------------------

සමාලෝචිත වර්ෂයට අදාළව 2018 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුමේ නම | 2017 වර්ෂයට අදාළ | |
|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව |
| (අ) විසර්ජන ගිණුම් | 34 | 34 |
| (ආ) පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 66 | 66 |
| (ඇ) පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 |
| (ඇ) වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | 08 |
| (ඉ) අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 04 | 04 |
| (ඊ) ආදායම් ගිණුම් | 02 | 02 |
| එකතුව | 115 | 115 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ඔක්තෝබර් 02 දිනැති අංක PED/POL/CIR/2013-3 දරන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් තැබීමේදී උපචිත පදනම උපයෝගී කරගත යුතු බව දක්වා තිබුණ ද සභාව එම නියමය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද එකතුව රු.42,818,377 ක් සහ ඉකුත් වර්ෂවල මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සඳහා අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකරණ ලියවිලි අනුව සමාලෝචිත වර්ෂයේ මුද්දර බදු ආදායම රු.6,747,015 ක් වුවත් එය රු.7,537,635 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.790,620 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රැස්කිරීම් ගිණුම් 02 ක එකතුව රු.286,799 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා බැංකු ශේෂය තුළ දක්වා තිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවට අයත් ආයතන 08 ක් විසින් 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව වර්ෂ 14 ක එකතු වටිනාකම රු.10,882,342 ක් වූ අග්‍රිම ශේෂ පියවා නොතිබුණි.

(ii) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් යටතේ දරන ලද රු.142,699,951 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුම යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ආයතන 11 ක එකතුව රු.5,734,703 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ කිහිපයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එන, සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමේ රු.1,969,736 ක ශේෂය කර්මාන්ත අමාත්‍යාංශයට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම
-------------------------------------------------

මධ්‍යම පළාත් සභාවේ ආයතන 69 ක එකතුව රු.433,489,306 ක පොදු තැන්පත් ශේෂවලට අදාළ කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| (i) 2013 අංක 17 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත | සභා ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබන මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරයාගේ හා විපක්ෂ නායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ 249 දෙනකු සඳහා 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා තිබූ එකතුව රු.292,514,758 ක දීමනා වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍යයා සහ සේවකයා ගෙවිය යුතු දායකය පිළිවෙලින් රු.35,101,771 ක් සහ රු.23,401,175 ක් අරමුදලට බැර කර නොතිබුණි. |
| (ii) 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 217(2) නියෝගයේ vi හි (ආ) වගන්තිය | වාර්ෂික බද්ද වර්ෂ 05 කට වරක් ප්‍රතිශෝධනය කර නොතිබීම හේතුවෙන් පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පල්ලේඔය කුඩා පරිමාණ ජල ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.480,000 ක් අඩුවෙන් අයකර තිබුණි. |
| (iii) පළාත් සභා පනතේ 19 වන වගන්තියේ (ඇ) ඡේදය හා මධ්‍යම පළාත් මූල්‍ය රීති 2.1 | ආයතන 04 කින් පළාත් සභා අරමුදලට බැරවිය යුතු එකතුව රු.4,156,000 ක් වූ ලැබීම් එම ආයතන වල සුභ සාධක සංගම් ගිණුම්වලට බැරකර තිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත | මෙම පනත යටතේ ලියාපදිංචිකර නොතිබුණු ස්වර්ණාභරණ ආයතනයකට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර නිකුත් කර තිබුණි. |
| (v) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ xiv ඡේදය හා 2015 ජූලි 06 දිනැති අංක SEC/2015/05 දරන චක්‍රලේඛය | ආයතන 02 ක නිළධාරින් 27 දෙනෙකුගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කල යුතු උපයනවිට බදු රු.494,845 ක් අඩුවෙන් අයකර තිබුණි. |
| (vi) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ xii පරිච්ජේදයේ 143 හා 147 වගන්ති | කළාප අධ්‍යාපන කාර්යාල 03 කට අයත් පාසල් 12 ක ගුරුභවතුන් 15 දෙනෙක්, ශ්‍රී ලංකා යුධ හමුදාවේ සක්‍රීය සේවයට මුදාහැර වර්ෂ 01 සිට වර්ෂ 26 දක්වා කාලයක් ගතව තිබුණද පත්කිරීමේ බලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර කළාප කාර්යාල 03 කට මුදාහැර තිබූ ගුරුභවතුන් 08 දෙනෙකු වර්ෂ 05 ක කාලසීමාව ඉක්මවා තිබුණද නැවත ගුරු සේවයට වාර්තා කර නොතිබුණි. |
| (vii) | 2016 අප්‍රේල් 20 දිනැති අංක 1963/30 දරන ගැසට් පත්‍රය | පළාත් නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ වාර්තා අනුව මධ්‍යම පළාත තුළ 2017 වර්ෂයේ දී අවුරුදු 5 ත් 16 ත් අතර පාසල් නොයන ළමුන් 848 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් තවදුරටත් පාසල්ගත කිරීමට සිටින ළමුන් 223 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (viii) | මධ්‍යම පළාත් සභාවේ කාර්ය පරිපාටි රීති සංග්‍රහයේ 56 වගන්තියේ 3 උපඡේදය | පළාත් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රු.6,842,009,245 ක පරිපූරක ඇස්තමේන්තු 03 ක් 2017 වර්ෂයේ දී සෘජුවම පළාත් සභාවට ඉදිරිපත් කර අනුමත කර ගෙන තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| xix පරිච්ඡේදයේ 5.2 සහ 5.4 වගන්ති | රජයේ නිවාසවල පදිංචි නිලධාරින්ගෙන් රු.246,511 ක නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |

(ඇ) මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | ප.මූ. රී. 30.1 | ප්‍රතිපාදන සලසා ගැනීමට පෙර රු.1,423,831 ක වැටුප් හා වේතන සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. |
| (ii) | ප.මූ.රී. 30.2.1 | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන වලින් රු.1,850,708 ක පුනරාවර්තන වියදම් දරා තිබුණි. |
| (iii) | ප.මූ.රී. 54.3.1, 54.5 හා 54.6 | ආයතන 06 ක වාහන 14 ක් අනතුරට ලක්ව තිබුණද ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වා අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | ප.මූ.රී.164 (ආ) | රු.1,241,200 ක් වටිනා භාණ්ඩ විෂයයන් 154 ක් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබියදී ගෙවීම් කර තිබුණි. |
| (v) | ප.මූ.රී. 183.1 | පේෂකර්ම දෙපාර්තමේන්තුව සහ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පිළිවෙළින් රු.7,226,977 ක සහ රු.7,519,234 ක ගෙවීම් සඳහා මුදල් ලද බව සනාථ කරන කුවිතාන්සි ලැබී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vi) | ප.මු.රී. 476 | මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ආයතන 120 ක 2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය කර නොතිබුණි. |
| (vii) | ප.මු.රී. 477.2.1 | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රෝහල් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 15 ක භාණ්ඩ වර්ග 194 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ 770(3) | මෝටර් රථ පරීක්ෂක/ යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකුගේ නිර්දේශකයකින් තොරව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | ආයතන 04 ක ට අයත් වාහන 23 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| (ඊ) | රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛ | |
| (i) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | කළාප අධ්‍යාපන කාර්යාල 05 ක ට අයත් පාසල් 257 ක ගුරුවරුන් 957 ක් වර්ෂ 08 සිට 28 දක්වා වූ කාලයක් එකම පාසැලක සේවය කරමින් පැවතුණි. |
| (ii) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 මැයි 16 දිනැති අංක 2016/17 දරන චක්‍රලේඛය | 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සිසුන් 147 ක් පාසල් 07 ක ට ඇතුළත් කර තිබුණි. |

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| (i) 3.3 ඡේදය | විශේෂ අවස්ථා වලින් බැහැරව සීමිත ලංසු කැඳවීම් යටතේ ඇස්තමේන්තු වටිනාකම රු.64,693,244 ක් වූ කර්මාන්ත 33 ක් සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. |
| (ii) 8.9.3 ඡේදය | ක්‍රීඩා දෙපාර්තමේන්තුවට රු.2,870,872 ක පාවහන් සහ පේෂකර්ම දෙපාර්තමේන්තුව රු.3,492,373 ක අත්‍යන්ත්‍ර මිලදී ගැනීමේ දී ශිෂ්‍යත්ව වලට එලඹ නොතිබුණි. |

03. ආදායම් කළමනාකරණය

-----------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2017 සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | 2017 තථ්‍ය ආදායම | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| ම -10 | නිෂ්පාදනය හා වියදම මත බදු | 6,756.11 | 6,633.98 | 6,030.66 | 6,173.57 |
| ම - 20 | විකුණුම් හා ගාස්තු | 697.89 | 771.90 | 735.34 | 806.87 |
| | එකතුව | 7,454.00 | 7,405.88 | 6,766.00 | 6,980.44 |

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකක හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2017 | 2016 | 2015 |
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන |
| දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | 32.40 | 22.88 | 24.13 |
| රජයේ ඉඩම් පනත යටතේ ගාස්තු | 15.83 | 9.83 | 2.77 |
| ඛණිජ අයිතිවාසිකම් සම්බන්ධ බදු | 2.00 | 0.40 | 0.20 |
| ව්‍යාපාරික පිරිවැටුම් බදු | 28.84 | 33.92 | 45.38 |
| මත්පැන් දඩ හා පොලී | 1.73 | 1.73 | 1.73 |
| උකස් බඩු ගන්නන්ගෙන් අයකරන ගාස්තු | 0.20 | 0.20 | 0.02 |
| එකතුව | 81.00 | 68.96 | 74.23 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර රු.35,616 සිට රු.419,412,614 දක්වා එනම් සියයට 13 සිට සියයට 96 ක් දක්වාවූ පරාසයක අඩුවීමක් පැවති අතර ආදායම් විෂයයන් 05 කට අදාළව ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර රු.4,550 සිට රු.100,510,190 දක්වා එනම් සියයට 6 සිට සියයට 2832 අතර පරාසයක වර්ධනයක් සිදු වී තිබුණි.

(ii) ආදායම් විෂයන් 07 ක ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.497,700 සිට රු.221,663,608 දක්වා එනම් සියයට 20 සිට සියයට 93 දක්වා අඩු වී තිබුණි.

04. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.28,112,420,432 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.27,415,737,187 ක් විය.

05. ප්‍රඥප්ති ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

මධ්‍යම පළාත් සභාවේ ස්ථාපිත ප්‍රඥප්ති ගිණුම් 3 කට සහ වාණිජ අත්තිකාරම් ගිණුම් 2 කට මතයක් ප්‍රකාශ කර නොමැති අතර වාණිජ අත්තිකාරම් ගිණුම් 3 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

5.1 ප්‍රඥප්ති ගිණුම්

5.1.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.474,070 ක් වූ බෝගම්බර බස් රථ ගාල් හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ආ) එකතුව රු.54,308,442 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව වත්කම් සමීක්ෂණ වාර්තා, උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛන ආදී උපයෝගි ලේඛන ඇතුළු සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2016 අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක වූ සහසර ව්‍යාපෘතිය වෙනුවෙන් ලද අරමුදලින් සියයට 79 ක් වන රු.21,034,431 ක් අරමුණට පටහැනිව සේවක අර්ථසාධක හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් ගෙවීමට හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීමට වැයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන මාර්ග වල මගී ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා විධිමත් කාඩ්පත භාවිතයට පෙළඹවීම හැරුණු විට පෞද්ගලික බස් සේවාව පැරණි තත්ත්වයෙන්ම විය.

(ඈ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් රු.434,951 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඉ) මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය අතර දත්ත අන්තර් සම්බන්ධතාවය හා විධිමත් තොරතුරු පද්ධතියක් ඇති කරලීමේ ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව ස්ථාපිත කර නොතිබූ අතර ගිවිසුම කඩ කිරීමට එරෙහිව නිතීමය පියවර ගැනීමට ද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඊ) හෙට්ටිපොල බස් නැවතුම්පලේ උඩු මහළ 2016 දෙසැම්බර් 05 දිනැති මුදල් කොමිෂන් සභා ලේකම්ගේ අංක FC/3/2/2017-(i) දරන ලිපියෙහි 4.2 ඡේදයට පටහැනිව 2017 ජනවාරි මාසයේ සිට ව්‍යාපාරික කටයුතු සඳහා බදු දී තිබුණි.

(උ) 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පාරිතෝෂික වෙන් කිරීම් කර අරමුදලක් ගොඩනගා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය දක්වා වෙන් කළ යුතු පාරිතෝෂික ප්‍රතිපාදනය රු.57,597,159 ක් විය.

5.1.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

---------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් 09 දෙනෙකු සඳහා වෘත්තීය දීමනා ලෙස රු.2,295,000 ක් මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතිය රහිතව ද සුදුසුකම් සපුරා නොමැති ඉංජිනේරුවරු 06 දෙනෙකු සඳහා රු.2,460,000 ක වෘත්තීය දීමනාවක්ද ගෙවා තිබූ අතර ඉංජිනේරුවරුන් 08 දෙනෙකු සඳහා වෘත්තීය හා ඉංජිනේරු දීමනාව වශයෙන් දීමනා 02 ක් ගෙවීම හේතුවෙන් රු.930,000 ක් වැඩිපුර ද ගෙවා තිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇති වාහන කුලියට ගෙන ඒ සඳහා වාහන කුලී ලෙස රු.1,344,020 ක් ගෙවා තිබුණි.

(ඇ) කුණ්ඩසාලේ හා ගම්පොල විධායක ඉංජිනේරු කාර්යාල වල පිළිවෙලින් රු.122,856 ක් වටිනා ලීටර් 180 තාර බැරල් 12 ක් හා වටිනාකම නොදැක් වූ ලීටර් 180 තාර බැරල් 96 ක් දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ඉංජිනේරු කාර්යාල දෙකෙහි එකතුව රු.3,375,000 ක් වටිනා ලෙලන තලන යන්ත්‍ර 05 ක වාර්ෂිකව වැඩකළ පැය ප්‍රමාණය 03 – 119 දක්වා අතර විය.

(ඈ) දොලොස්බාගේ බෙරවිල පටිතලාව මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය නිම කර නොතිබියදී අවසන් වාර්තාවක් පිළියෙල කර රු.4,085,919 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර ඉටු නොකළ වැඩ කොටස් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබියදී එම මාර්ගයේ ඉදිරි කටයුතු වලට අදාළ ටෙන්ඩරයද එම කොන්ත්‍රාත්කරුටම පිරිනමා තිබුණි.

(ඉ) 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පාරිතෝෂික සඳහා වෙන්කර ඇති රු.21,978,049 ක් ආයෝජනය කර නොතිබුණි.

(ඊ) අධිකාරිය පිහිටුවා ගත වී ඇති වර්ෂ 09 ක කාලය තුළ වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණ අතර ආයතනය සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

5.1.3 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

-----------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 අංක 01 දරන මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තියේ 6.5 වගන්තිය ප්‍රකාරව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණු අතර ආයතනය පිහිටුවීමේ ප්‍රඥප්තියට අනුව සහකාර අධ්‍යක්ෂ තනතුරක් පමණක් අනුමත වී තිබුණ ද සහකාර අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කටුකිතුල ගිමන් හල බදු පදනම මත ලබා ගැනීමේ දී එකඟවූ බදු කොන්දේසි උල්ලංඝනය කරමින් තෙවන පාර්ශවයකට අවස්ථා දෙකකදී වර්ෂ 03 බැගින් උප බදු දී තිබුණු අතර ඔවුන් විසින් රු. මිලියන 6 ක් වැයකර ස්ථාවර ඉදිකිරීම් සිදුකර ආකෘතිමය වෙනස්කම්ද සිදු කර තිබුණි. 2018 ජූනි 30 දින වන විට තෙවන පාර්ශවයෙන් රු.1,274,890 ක හිඟ උප බදු මුදලක් අයවීමට තිබියදී නැවත වරක් එම ආයතනයටම උප බදු දී තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

------------------------------

5.2.1 මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ විෂය අංක 581202 දරන පේෂකර්ම වැඩපළ පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

----------------------------------------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන ණයට විකුණුම් වලින් අයවිය යුතු රු.11,687,027 ක් ද භාණ්ඩ සමීක්ෂණ වලින් හඳුනාගන්නා ලද රු.7,507,631 ක ඌනතාවයද, වර්ෂ ගණනාවක සිට ප්‍රධාන ලේකම් නමින් පැවත එන ලැබිය යුතු රු.16,712,065 ක් ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.30,526,783 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළව කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් හා උපලේඛන යන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ජේෂකර්ම මධ්‍යස්ථාන 29 ක ජේෂකර්ම පටු යන්ත්‍ර 43 ක් හා පළල් යන්ත්‍ර 144 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ඈ) ජේෂකර්ම මධ්‍යස්ථාන 76 ක ඉලක්ක ගත අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය තථ්‍ය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී සියයට පනහකටත් වඩා අඩුවෙන් නිෂ්පාදනය කර තිබුණි.

5.2.2 මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය අංක 582202 දරන නිෂ්පාදන හා විකුණුම් පිළිබඳ අත්තිකාරම් ගිණුම.

---

(අ) වර්ෂ 04 සිට වර්ෂ 13 දක්වා කාල පරාසයකට අයත් අවස්ථා 03 කට අදාළ රු.6,463,685 ක ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.282,864,209 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම සඳහා අයිතිය තහවුරු කෙරෙන ලේඛන නොතිබුණි.

5.3 අනෙකුත් අත්තිකාරම් ගිණුම්

5.3.1 පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

දෙපාර්තමේන්තු 02 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වසර 02 ඉක්මවූ ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.89,274,841 ක් හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් වෙනුවෙන් පියවිය යුතු රු.43,177,446 ක ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මිය ගිය, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින්ගේ වසර 02 ඉක්මවූ ණය ශේෂය රු.3,328,917 ක් විය.

5.3.2 පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අත්තිකාරම් ගිණුම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා මන්ත්‍රීවරයෙකු මන්ත්‍රී ධූරය අත්හැරීම, මන්ත්‍රී ධූරයෙන් පහ කිරීම, මියයෑම හෝ පළාත් සභාව හදිසියේ විසුරුවා හැරීම වැනි හේතු මත මන්ත්‍රීධූරය අහෝසි වන අවස්ථාවක දී පළාත් සභාවට අයවිය යුතු සියලුම ණය මුදල් එක්වර සම්පූර්ණයෙන් අයකර ගැනීමට පළාත් සභාව පියවර ගත යුතු වුවත් මන්ත්‍රීවරුන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 558,106 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ දී ධූරය හැර ගොස් තිබුණු මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු.157,114 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

06. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

6.1 කාර්ය සාධනය
-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙළුම් 03 කින් සමන්විත මැදරට වංශ කථා ග්‍රන්ථයේ වැඩකටයුතු 2010 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබුණද රු.5,088,107 ක් වැයකර පළමු වෙළුමෙන් ග්‍රන්ථ 1,500 ක් මුද්‍රණය කර ඉන් ග්‍රන්ථ 1,354 ක් 2018 ජනවාරි වනවිටත් අදාළ අංශ වෙත බෙදානොහැර ගබඩා කර තිබුණි.

(ආ) ලියාපදිංචි සමූපකාර සමිති 1,435 කින් සමිති 959 ක පමණක් 2017 වර්ෂයේ විගණනය සැලසුම් කර තිබුණු අතර ඉන් සමිති 279 ක විගණනය අවසන් කර නොතිබුණි. ඒ අනුව විගණනය සැලසුම් නොකළ හා අවසන් නොකළ සමිති සංඛ්‍යාව 755 ක් හෙවත් සියයට 53 ක් විය.

(ඇ) මධ්‍යම පළාත තුළ විද්‍යුත් ආදායම් බලපත්‍ර (ERL) ක්‍රමය ස්ථාපිත කර වර්ෂ 02 ක් සම්පූර්ණ වී තිබුණ ද මෝටර් වාහන බලපත්‍ර ආදායම් වෙනුවෙන් අයවීමට තිබුණු ආදායම, එකතු කරන ලද ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පැහැදිලිව ලබාගත හැකි වන අයුරින් අදාළ පරිගණක වැඩසටහන වැඩිදියුණු කර නොතිබුණු බැවින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රධාන අරමුණ ඉටුවී නොතිබුණි.

(ඈ) සහන නිවාස වැඩසටහන සම්බන්ධයෙන් පළාත් නිවාස දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එළඹි ගිවිසුම අනුව බැංකුව යෝජිත ප්‍රතිලාභීන් සඳහා ණය මුදල් ලබා නොදීම නිසා එකතුව රු.18,152,465 ක් බැංකුව තුළ රඳවා ගැනීමෙන් එම මුදල් ඵලදායී කාර්යයක ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකිව තිබූ ප්‍රතිලාභ දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණු අතර ඍජු ණය හා පරාස ණය ක්‍රමය යටතේ ලබා දී ඇති එකතුව රු. 2,742,911 ක් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) සඳහා වෙන් කල ප්‍රතිපාදන වලින් 2017 වර්ෂය අවසන් වනවිට රු.742,256,159 ක් හෙවත් සියයට 37ක් ඉතිරි වී තිබූ අතර ව්‍යාපෘතියට අදාළ රු.7,460,000 ක් වටිනා කර්මාන්ත 06 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියට අදාළව 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.6,119,235 ක් වටිනා භාණ්ඩ හා උපකරණ 2018 මාර්තු වනවිටත් අවශ්‍ය පාසල් අතර බෙදා නොහැර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඊ) පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය උප ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.මිලියන 141.89 ක් ගෙවා තිබුණු නමුත් 2018 මාර්තු වන විටත් සැලසුම්ගත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

(උ) පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,912,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු නමුත් රු.1,926,185 ක කාර්යයන් හෙවත් සියයට 66 ක් පමණක් ඉටු කර තිබුණි.

(ඌ) මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු.1,040,000 ක වියදමින් මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල බෙලිගමුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපලෙහි පොකුණක් ඉදි කර තිබුණද ඒ තුළ මිරිදිය මත්ස්‍ය වගාවට ප්‍රමාණවත් ජල ධාරිතාවයක් නොතිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පවුල් 28 ක සාමාජිකයන් මඩොල්කැලේ වත්ත උනනගල ජල යෝජනා ක්‍රමයෙන් ලබා ගන්නා පානීය ජලය පානය සඳහා නුසුදුසු බව තහවුරු වී තිබියදීත් ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ ඉඩම් ආඥාපනත පිළිබඳ කාර්ය සංග්‍රහයේ 269 නියෝගය ප්‍රකාරව පළාත් පාලන ආයතන/රජයේ දෙපාර්තමේන්තු වලට අයත් ආයතන පිහිටා ඇති ඉඩම් අදාළ ආයතනවලට පවරා දීම කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ට අයත් ආයතන 252 ක් හා පාසැල් 569 ක ට අදාළ ඉඩම් පවරාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1982 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පුද්ගලයින් 65 දෙනෙකු වෙත නිකුත් කරන ලද ප්‍රදාන පත්‍ර 63 ක් 2018 පෙබරවාරි 27 දින වනවිටත් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ඇ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක් නීත්‍යානුකූල බදු ගිවිසුමක් නොමැතිව 1984 නොවැම්බර් සිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් භුක්ති විඳිමින් පවතින හෙක්ටයාර 2.52 ක් වන මෙම ඉඩම සඳහා 2012 වර්ෂයෙන් පසු කිසිදු බදු මුදලක් අය කර නොතිබුණි. ඊට අමතරව විවිධ අරමුණු සඳහා ආයතන 05 ක ට දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී තිබුණු ඉඩම් පිළිබඳව ද පසු විපරම් කටයුතු ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබුණි.

(ඉ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම්වල 2005 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 4 ක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත බදු අය කිරීමටත්, ග්‍රාම සේවා වසම් 131 ක අනවසර පදිංචිකරුවන් 341 කගේ ඉඩම් නීත්‍යානුකූල කිරීමටත් 2018 පෙබරවාරි 21 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) වත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් විද්‍යාලයක් විසින් වර්ෂ 57 කට වැඩි කාලයක් බුක්ති විඳි ක්‍රීඩා පිටියෙන් කොටසක් බස් රථ ගාලක් ස්ථාපනය කිරීම සඳහා කුණ්ඩසාල ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි.

(උ) මුල්පත්වීම් දිනය අනුව පරිවාස කාලය සම්පූර්ණ කර වර්ෂ 03 සිට 38 දක්වා කාලයක් ගතවී තිබුණු හැටන්, ගම්පොල, මහනුවර හා දෙනුවර අධ්‍යාපන කලාපවල ගුරුවරුන් 80 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කර නොතිබුණු අතර, හැටන් අධ්‍යාපන කලාපයේ පාසැල්වල ගුරුවරු 464 දෙනෙකුට 2017 දෙසැම්බර් වනවිට මාස 01 සිට වර්ෂ 09 දක්වා කාල පරාසයක් ප්‍රමාදවී තිබුණද වැටුප් වර්ධක ලබාදී නොතිබුණි.

(ඌ) දෙනුවර, ගම්පොල, වත්තේගම, තෙල්දෙණිය, වලපනේ හා හඟුරන්කෙත කලාප වල වෙනත් සේවාවන් සඳහා අනුයුක්ත කර තිබුණු ගුරුවරුන් 19 දෙනෙකු සඳහා පළාත් සභා අරමුදලෙන් ගෙවා ඇති රු.28,086,170 ක වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(එ) මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් නිවාස 335 කින් 123 ක් අභාවිතව පැවති අතර ඉන් 39 ක් අබලන් හා ගරා වැටී ඇති නිවාස ලෙස හඳුනාගෙන තිබුණි.

(ඒ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ රු.41,461,389 ක ප්‍රතිපාදන මත ඉදිකර 2017 මාර්තු මාසයෙහි මහජන අයිතියට පත් කරන ලද විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු රෝගී සායන, වෛද්‍යවරුන් නොමැතිකමින් ගොඩනැගිල්ල හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

(ඔ) පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට 2015 හා 2016 වර්ෂවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබූ රු.1,158,840 ක ප්‍රතිපාදන අදාළ ව්‍යාපෘති සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබූ අතර, විදුලි බල අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක නොකල ව්‍යාපෘති 03 ක ට අදාළ රු.1,440,128 ක් වර්ෂ 07 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන පසුව පළාත් සභා ආදායමට බැර කර තිබුණි.

(ඕ) මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ක්‍රියාකාරී විවිධ සේවා සමූපකාර සමිති 41 කින් සහ සණස, වතු නිවාස, පාසල් හා වෙනත් සමූපකාර සමිතිවලින් 2017 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු රු.158,405,066 ක හිඟ මුදල් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වායු සමීකරණය කර නොතිබුණු ආයතනයකට ෆාමසියක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත්කර තිබුණි.

(ආ) 2014,2016 සහ 2017 වර්ෂවල නිකුත් කරන ලද දීමනා පත්‍ර 05 ක් අදාළ දීමනාලාභීන් වෙත බෙදා හැර නොතිබූ අතර 2012 වර්ෂයට පදනම්ව ඉඩම් කැබලි 03 කට අදාළව තක්සේරු කර ඇති රු.1,485,000 ක් ඉඩම් භුක්ති විඳින්නන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගම්පොල කලාපයේ පාසල් 04 ක මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 3.1281 ක් වර්ෂ ගණනාවක සිට අනවසරකරුවන්ගේ ග්‍රහණයට ලක්වෙමින් පැවති අතර ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් අනවසරයෙන් පරිශීලනය කිරීම වෙනුවෙන් 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයකරගත යුතු රු.2,972,840 ක බදු මුදල අයකර ගැනීමට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) සභා ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ පළාත් සභා මැති ඇමතිවරුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබා දීමේ වැඩසටහන යටතේ ධූරධාරීන් 26 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.2,789,100 වටිනා පරිගණක 26 ක් ගිවිසුම් ප්‍රකාරව නැවත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මානෙල්වල හයිඩ්‍රොපවර් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා භාවිතා කර තිබූ රජයේ ඉඩම සඳහා 2003 වර්ෂයේ සිට 2017 දක්වා වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් අයවිය යුතු රු.1,042,340 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කුඩා ජල විදුලි බලාගාර 06 කින් අයවිය යුතු රු.7,718,600 ක බදු මුදල් හා රජයේ ඉඩම් වලින් දීර්ඝ කාලීන බදු ලෙස අයවිය යුතු රු.909,154 ක් අයකර ගෙන නොතිබුණි.

6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යම රජයේ කිසිදු චක්‍රලේඛයකින් අධීක්ෂණ මන්ත්‍රී දීමනා ගෙවීමට ඉඩසලසා නොතිබියදී ප්‍රධාන අමාත්‍යාංශයේ කාර්යයන් අධීක්ෂණය සඳහා මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට 2017 වර්ෂයේදී රු.1,371,255 ක් ගෙවා තිබුණි.

(ආ) මධ්‍යම පළාත් විද්‍යාලයක පාසල් සංවර්ධන සමිති ගිණුමකින් නිකුත් කරන ලද එකතුව රු. 621,956 ක චෙක්පත් 33 ක් ගෙවීම් ලබන්නා ලෙස මුදල් පොතේ සඳහන් තැනැත්තා වෙනුවට චෙක්පතේ නම සඳහන් ආදායකයාට ගෙවා තිබුණි.

(ඇ) ප්‍රමිතියෙන් තොරවීම නිසා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ඉවත් කරන ලද කල් ඉකුත් නොවූ ඖෂධ වල වටිනාකම දළ වශයෙන් රු.3,028,815 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයට අයත් රෝහල් සඳහා ඉල්ලුම් කළ ඖෂධ වර්ග 76 කට අයත් ඖෂධ කිසිවක් ලැබී නොතිබුණි.

(ඈ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හදිසි සංවර්ධන අවශ්‍යතා සඳහා වූ ප්‍රතිපාදන වලින් හදිසි නොවන සංවර්ධන කටයුත්තක් සඳහා රු.1,348,150 ක් ද අඩු පහසුකම් සහිත කෝවිල් වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ ප්‍රතිපාදනවලින් ඉහළ ආර්ථික ශක්තියෙන් යුතු බැතිමතුන් සිටින කෝවිල් 4 ක් සඳහා රු.2,210,000 ක් හා රජයේ ප්‍රතිපාදන වැය කළ නොහැකි පෙර පාසලක් සඳහා රු.1,241,010 ක් වැය කර තිබුණි.

(ඉ) විදුලිබල අමාත්‍යාංශය විසින් කුඩා ජල විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා සමිතියක් වෙත ලබාදී තිබුණු රු.2,000,000 ක මුදලින් රු.1,708,451 ක් නැවත අමාත්‍යාංශයට ලබාගෙන පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 03 ක් රඳවාගෙන මුදල් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව විදුහලකට ට්‍රාන්ස්පෝමරයක් ලබා දීම සඳහා නිදහස් කර තිබුණි.

6.5 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මන්ත්‍රීවරුන් සඳහා රු.20,958,609 ක් වැය කර ඉදිකර තිබුණු සංචාරක නිවාසය ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) පැරණි සභා ලේකම් කාර්යාලයේ සභා ගර්භය හා ලී බඩු ඇතුළු උපකරණ වර්ෂ 05 ක කාලයක සිට ද, 2011 වර්ෂයේ දී රු.39,881,670 වියදමින් ඉදිකල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ කාමර 14 ක් වර්ෂ 03 ක කාලයක සිට ද, නිෂ්කාර්යව පැවති අතර පිරිස් හා පුහුණු අංශයේ කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සතු නේවාසිකාගාරය ද ඌන උපයෝජිතව පැවතිණි.

(ඇ) තෙල්දෙණිය කලාපයේ විදුහලක රු.මිලියන 24.83 ක් වැයකර ඉදිකර තිබුණු පරිපාලන ඒකකය හා උසස් පෙළ විද්‍යාගාර 03 කින් යුතු තෙමහල් ගොඩනැගිල්ල වර්ෂ 06 ක සිට හා රු.2,700,000 ක් වැයකර මිලදීගෙන තිබුණු රසායන ද්‍රව්‍ය හා විද්‍යාගාර උපකරණ වර්ෂ 07 ක පමණ කාලයක සිට ද ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහලේ 2017 අප්‍රේල් මාසයේදී විවෘත කළ දැඩි සත්කාර ඒකකය, ශල්‍යාගාර 03 කින් සමන්විත ශල්‍යාගාරය, ලේ බැංකුව හා අදාළ වෛද්‍ය ඒකක තුළ ස්ථාපිත කර තිබුණු රු.76,941,550 ක් වටිනා වෛද්‍ය උපකරණ වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

(ඉ) යටිනුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට, දිගන පුනරුත්ථාපන රෝහලට, යක්ගහපිටිය ප්‍රාදේශීය රෝහලට, මැණික්හින්න ප්‍රාදේශීය රෝහලට හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලබාදී තිබූ වෛද්‍ය උපකරණ ඒකක 226 ක් නිශ්කාර්යව පැවතිණි.

6.6 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

අදියර 2 ක් යටතේ 2014 හා 2015 වර්ෂවල ඉදිකළ නාලන්දා ගෙඩිගේ ආශ්‍රිත සංචාරක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,442,841 ක් වැයකර තිබුණද 2017 වර්ෂය අවසන් වනවිටද ඵලදායි කටයුත්තක් සඳහා යොදාගත නොහැකි තත්වයේ පැවතුණි.

6.7 හඳුනා ගන්නා ලද පාඩු
---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩසටහන් 03 කට අදාලව තවදුරටත් අයකර ගැනීමට පවතින රු.14,985,229 ක වටිනාකමැති හානි පාඩු සිද්ධි 139 කින් වටිනාකම රු.8,666,209 ක් වන සිද්ධි 83 ක් වර්ෂ 05 ක් ඉක්මවා තිබුණි.

(ආ) අනතුරට පත්වූ වාහන 123 ක පාඩුව වූ රු.16,665,286 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබූ අතර එයින් පාඩුව රු.7,086,818 ක ට අදාළ වාහන 39 ක් අනතුරට පත්වී වර්ෂ 05 ක ට වැඩි කාලයක් ගත වී තිබුණි.

6.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තෙල්දෙණිය කලාපයේ විදුහලක රු.1,900,149 ක් වැයකර ඉදිරිකරන ලද කාන්තා වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ඇස්තමේන්තුව හා ප්‍රමාණ පත්‍ර අතර වෙනස්කම් පැවති අතර ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයන් අඩුපාඩු සහිතව ඉදිකර තිබුණි. එසේම සියලුම විදුලි හා ජලනල උපාංග සවිකර තිබුණද ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය හා ජල නල සැපයුම ලබා දී නොතිබුණි.

(ආ) ඉහත සඳහන් විද්‍යාලයේ විද්‍යාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියාව හා අළුතින් කොටසක් එකතු කිරීමේ කර්මාන්තයේ ප්‍රමාණ පත්‍රයේ ඇතුළත් වැඩ විෂයන් නිසි පරිදි ඉටුකර නොතිබුණු අතර රු.34,560 ක් වන ටයිල් 229 ක් ද රු.35,639 ක් වටිනා සිවිලින් ෂීට් 64 ක් ද වැඩියෙන් මිලට ගෙන තිබුණි. ඇස්තමේන්තු ප්‍රකාර වැඩ විෂයයන් ඉටුනොකිරීම හා අධි ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් කර්මාන්තය සඳහා ලබාදුන් මුදලින් සියයට 46 ක් එනම් රු.921,141 ක් ඉතිරිවී තිබුණි.

(ඇ) පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2016 හා 2017 වර්ෂවල දී එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබූ රු.මිලියන 337.53 ක කොන්ත්‍රාත් 21 කින් 13 ක් අවලංගුවී තිබුණු අතර 07 ක ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2017 වර්ෂය අවසානයට කොන්ත්‍රාත් ආයතනයෙන් රජයට අයවියයුතු අත්තිකාරම් හා කාර්ය සාධන ඇපකරවල මුළු වටිනාකම රු.49,849,343 ක් විය.

6.9 ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය තුළදී ඉටුකිරීම සඳහා සැලසුම්කර තිබූ රු. 60,479,905 ක ව්‍යාපෘති 04 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් රු.4,296,555 ක ඇස්තමේන්තුගත වටිනාකමින් යුත් පානීය ජල යෝජනා ක්‍රම 03 ක් හා වතු මාර්ගයක් ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

6.10 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශ (රේඛීය) ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක රු.50,040,860 ක ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂයේදී අවසන් කර නොතිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂවල දී රු.1,190,406 ක් වැයකර ඉදිකළ හුළුගඟ දිය ඇල්ල පිවිසුම් මාර්ගය හා නැරඹුම් මැදිරිය 2017 වර්ෂය අවසන් වනවිටත් ඉතිරි වැඩ නිමකොට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන රු.22,740,000 ක් වටිනා ව්‍යාපෘති 4 ක 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවතිණි.

(ඈ) නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ළය චිකිත්සාගාරයේ ඉදිකිරීම් සඳහා 2016 සහ 2017 වර්ෂවල එකතුව රු.මිලියන 17 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 ක් විය.

(ඉ) පළාත් ආයුර්වේද රෝහල සඳහා ඇඳන් 96 කින් යුතු නව වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 15 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට මුල්ගල තැබීම පමණක් සිදුකර තිබුණි.

6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

---

2017 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

6.11.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන හා ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතන වල සේවක සංඛ්‍යාව (පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 996 | 639 | 368 | 14 |
| තෘතියික මට්ටම | 302 | 188 | 117 | 8 |
| ද්වීතියික මට්ටම | 7,583 | 4,934 | 2,726 | 101 |
| ප්‍රාථමික මට්ටම | 6,814 | 5,453 | 1,148 | 432 |
| කොන්ත්‍රාත් පදනම මත | - | 35 | | - |
| අනියම් | | 188 | - | |
| වෙනත් | 341 | 730 | 65 | |
| එකතුව | 16,036 | 12,167 | 4,424 | 555 |

(අ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම මැයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව මධ්‍යම පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාව 2018 මැයි වන විට ද සංශෝධනය කරගෙන නොතිබුණි.

(ආ) විදුලිබල අමාත්‍යාංශයේ සේවකයින් 44 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා එක් සේවකයෙකුගේ අතිරික්තය විධිමත් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 2 කට හා අධිකාරි 2 ක ට අවිධිමත් ලෙස විවිධ තනතුරු වලට නිලධාරීන් 24 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී අනුයුක්ත කර තිබුණි.

(ඇ) ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව අත්‍යාවශ්‍ය ප්‍රමාණ මිනින්දෝරු, පරිපාලන නිලධාරි, තාක්ෂණ නිලධාරි, රසායනාගාර කාර්මික හා යන්ත්‍ර ක්‍රියාකරු යන අනුමත තනතුරු 08 ක් හා අනෙකුත් සේවාවල පුරප්පාඩු 46 ක් පැවති අතර අවශ්‍ය සේවක සංඛ්‍යාව තීරණය කර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 23 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර 2013 ජූලි 04 දින සිට හා ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා නිලධාරී තනතුර 2014 පෙබරවාරි 08 දින සිට පුරප්පාඩුව පැවතුණි.

6.11.2 පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,491 | 1,106 | 416 | 31 |
| නියෝජ්‍ය විදුහල්පතිවරු | 196 | 531 | 55 | 390 |
| ගුරුභවතුන් | 24,818 | 27,809 | 1,189 | 4,180 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 2,285 | 1,735 | 951 | 401 |
| එකතුව | 28,790 | 31,181 | 2,611 | 5,002 |

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අතිරික්ත ගුරුභවතුන් සංඛ්‍යාව 4,180 ක් විය.

(ආ) ගම්පොල අධ්‍යාපන කලාපයට අයත් පාසල් 32 ක ගුරු පුරප්පාඩු 96 ක් පැවති අතර කොත්මලේ අධ්‍යාපන කලාපයේ පාසැල් 19 ක වර්ෂ 01 සිට 11 දක්වාද, හැටන් අධ්‍යාපන කලාපයේ පාසැල් 20 ක වර්ෂ 01 සිට වර්ෂ 22 දක්වාද, නුවරඑළිය අධ්‍යාපන කලාපයේ පාසැල් 21 ක වර්ෂ 02 සිට වර්ෂ 21 දක්වාද, හඟුරන්කෙත අධ්‍යාපන කලාපයේ පාසැල් 24 ක වර්ෂ 01 සිට වර්ෂ 17 දක්වාද වූ කාල පරාසයක් තුළ විදුහල්පති තනතුරුවල පැවති පුරප්පාඩු සම්පූර්ණකර නොතිබුණි.

(ඇ) 2017 මාර්තු 16 දින වනවිට විල්ගමුව අධ්‍යාපන කලාපයට අයත් පාසල් 51 න් පාසල් 19 ක විදුහල්පති සේවයේ පුරප්පාඩු පැවති අතර, පාසල් 42 ක ගුරුභවතුන් 107 දෙනෙකුගේ පුරප්පාඩු හා ගුරුභවතුන් 181 ක අතිරික්තයක් පැවතුණි. එමෙන්ම කලාපයට අයත් පාසල්වල ගුරුභවතුන් 613 දෙනාගෙන් 51 දෙනෙකු විවිධ හේතු මත තාවකාලිකව වෙනත් කලාපවලට අනුයුක්ත කර තිබුණි.

(ඈ) තෙල්දෙණිය කලාපයේ පාසැල් කාර්ය සහායකයින් 98 දෙනෙකු අතිරික්තව පැවති අතර, එම කලාපයේ හා වත්තේගම කලාපයේ පාසැල්වල මුරකරුවන් 25 දෙනෙකු අතිරික්තව පැවතුණි.

6.11.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,233 | 960 | 273 |
| තෘතියික මට්ටම | 384 | 303 | 81 |
| ද්විතියික මට්ටම | 4,584 | 3,498 | 1,086 |
| ප්‍රාථමික මට්ටම | 3,253 | 2,502 | 751 |
| වෙනත්(අනියම් තාවකාලික) | - | 291 | - |
| එකතුව | 9,454 | 7,554 | 2,191 |

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවක මට්ටම් 04 ක් සඳහා තනතුරු 9,454 ක් අනුමත කර තිබුණු නමුත්, සේවයේ යොදවා තිබුණේ සේවකයින් 7,263 ක් පමණක් බැවින් තනතුරු 2,191 ක පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු අතර විශේෂඥ වෛද්‍යවරුන් 37 ක්, වෛද්‍යවරුන් 266 ක්, හෙද සේවාවේ 355 ක් හා පවුල් සෞඛ්‍ය සේවිකා 155 ක් පැවති අතර, සෞඛ්‍ය කාර්ය සහායක තනතුරු 552 ක ද පුරප්පාඩු පැවතුණි. ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පැවති පුරප්පාඩු 751 න් 291 ක් සඳහා අනියම් සේවකයන් බඳවාගෙන තිබුණි.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 ප්‍රසම්පාදනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර රු. 8,135,960 ක ගෘහ භාණ්ඩ මධ්‍යම පළාත් ආණ්ඩුකාර නිල නිවසට මිලදී ගෙන තිබූ අතර අදාළ චෙක්පත සැපයුම්කාර ආයතනය නමින් නිකුත් නොකර පෞද්ගලික නමකට නිකුත් කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11(අ) හා 5.4.8(ආ) ඡේදවලට අනුව ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් සඳහා ලංසු හා කාර්යසාධන සුරක්ෂණ පිළිගත් ආයතනයකින් ලබාගත යුතු වුවත් මධ්‍යම පළාත් පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම් 06 ක් සඳහා ලබාගෙන තිබූ රු.1,757,500 ක් වටිනා බැංකු ඇපකර ව්‍යාජ ඒවා විය. තවත් ගොඩනැගිලි ඉදිකිරීම් 04 ක් සඳහා ලබාගෙන තිබූ රු.5,844,880 ක් වටිනා අත්තිකාරම් ඇපකර 02 ක සහ රු.1,418,800 ක් වූ කාර්යසාධන ඇපකර දෙකක වලංගු කාලය අදාළ ලිපිගොනු හා බැංකු සනාථ ලිපි අනුව පරස්පර විය.

(ඇ) මධ්‍යම පළාත් සභා පාසලක් විසින් අවස්ථා 72 කදී රු.3,023,415 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

7.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම
-----------------------------------

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2011 | 2013.03.28 | 2015.09.08 |
| 2012 | 2014.07.04 | 2016.02.16 |
| 2013 | 2015.01.07 | 2015.05.05 |
| 2014 | 2015.10.08 | 2015.11.03 |
| 2015 | 2016.11.16 | 2017.07.18 |
| 2016 | 2017.11.29 | 2018.06.11 |

7.3 නොවිසඳී ඇති විගණන ඡේද
---------------------------------

විදුලිබල අමාත්‍යාංශය, මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය, නිවාස දෙපාර්තමේන්තුව, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, කර්මාන්ත අමාත්‍යාංශය සහ ඒ යටත් වූ දෙපාර්තමේන්තු 04 ක විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු නිම නොවූ ඡේද 197 ක් සම්බන්ධයෙන් 2018 ජූනි 30 දින වනවිටත් තීරණයක් ගෙන නොතිබුණි.

7.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

-------------------------------------------

පළාත් සභාවේ මූලික අරමුණුවලට අනුකූල නොවන අයුරින් 2010 වර්ෂයේ සිට රාජ්‍ය බැංකු දෙකක එකතුව රු.1,289,452,326 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

08. පද්ධති හා පාලන

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර මධ්‍යම පළාත් ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ආදායම් පරිපාලනය | (i). ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම.<br>(ii). ආදායම් හා හිඟ ආදායම් අයකර නොගැනීම.<br>(iii). ආදායම් උත්පාදක ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් නොකිරීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | (i). ස්ථාවර වත්කම් ඌන උපයෝජනය.<br>(ii). වාර්ෂිකව වත්කම් සමීක්ෂණය නොකිරීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩල අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබීම. |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | (i). අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම<br>(ii). ක්‍රියාත්මක කොන්ත්‍රාත්වල ප්‍රගතිය පරීක්ෂා නොකිරීම. |
| (ඉ) මූල්‍ය පාලනය | අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගැනීම. |